ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 නොවැම්බර් 26 සඳුදා
05 වෙළුම - 06 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය



## ආගමන කාලය එළඹුනා

### ජේසු බිළිඳුන්ගේ උපතට පුංචි ඔබත් සූදානම්ද ?

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ආගමන කාලයේ සියලු දෑ තුළ ධර්මෝපදේශ අගය ඉහළයි.

## ආදරණීය දුවේ පුතේ...

තවත් ආගමන කාලයක් උදා වෙන්න බොහෝම ලඟයි. ආගමන කාලය ලංවෙත්ම නත්තලේ මිහිරියාව ගැනත් අපේ මතකය අවදි කරනවා. ආගමන කාලය ලංවෙත්ම පරිසරයෙත් විශාල වශයෙන් වෙනස්කම් සිදු වන බව අපට දැනෙනවා. හිමිදිරි උදයේ හමා යන සුළඟේ තිබෙන සීතල බව, මල් ගස්වල නැවුම් බවකින් පිපෙන මල් පොහොට්ටු, කුරුළු ගීත, මේ සියල්ලකම උඳුවප් නත්තලේ සැඟවුනු ලයාන්විත බව සැබවින්ම අපට දැනෙනවා නේද?.

ආදර දුවේ පුතේ, ආගමන කාලය තුළත්, නත්තල තුළත් කිතුනු අපි අත් දකින සෑම ජන වන්දනා කාර්යයක් තුළම අන්තර්ගත ධර්මෝපදේශ අගයක් තිබෙන බව අප වටහා ගත යුතුයි. විශේෂ යෙන්ම නත්තලට පෙර එහි ඇති මේ ධර්මෝපදේශ අගය පිළිබඳව පුංචි ඔබ මනා වැටහීමක් ඇති කර ගන්නවා නම් නත්තල එළඹෙත්ම වඩාත් අර්ථාන්විත හා ධර්මානුකූල කිතු උපතේ ආධ්‍යාත්මයක් ඔබ සැමට අත් විඳින්නට පුළුවන්.

බලන්න, ආගමන සමය එළඹිලා, සති තුන ඉක්ම යත්ම ඔබ හැම කෙනෙක්ම නිවසේ විවිධ සංකේත ඉදි කරන බව අපි දන්නවා. විශේෂයෙන්ම නත්තලේ ප්‍රීතිය ගෙදර සාමූහිකව බෙදා ගන්න ඔබ නිවස තුළ කුඩා ගවලෙනක් නිර්මාණය කරනවා නේද? ඒත් එක්කම නත්තල් ගස ඉදි කිරීම , නත්තල් සීයා, නත්තල් සුබ පැතුම් පත්, නත්තල් මුද්දර , නත්තල් කැරොල් ගීත, නත්තල් අවුරුදු උත්සව, නත්තල් නෑ ගමන් බිමන් මේ සියල්ලම ආගමික වත් පිළිවෙත් වලින් බැහැර නමුත් නත්තල් සිරිය පුදුමාකාර ලෙස සිහි ගැන්වෙන නත්තල් සිරිත් ලෙස හඳුන්වා දිය හැකියි.

ආදර දුවේ පුතේ, සහාව සාමකාමී තත්ත්වයට පත්වූ මුල් වකවානුවෙහිදී ගවලෙන නත්තල සැමරීමේ වැදගත්ම සංකේතයක් වුනා. ගවලෙනක ස්වරූපය විවිධ ජාතීන්ගේ මිනිස් හැඟීම තුළ විවිධව නිර්මාණය වෙන බව අපි දන්නවා. නමුත් එහි ඇතුලත දිවයන සත්‍ය කථාන්දරය , එනම් මරිය තුමිය හා ජුසේ තුමා ආගන්තුකයන්ව සිටි අවස්ථාවේ ඔවුනගේ පිහිට උපකාරයට මුල් වූයේ මේ සංකේතයයි. ඒ නිසා ගවලෙනෙහි ඇතුලාන්ත සිද්ධි කථාන්දරය ඕනෑම ජාතියක ක්‍රිස්තු භක්තිකයකුට අවබෝධ කරගන්න අපහසු වන්නෙ නැහැ. ඒ අනුව මේ සංකේතය හා සිද්ධි සමූහය කදිම ධාර්මික හැඟීමක් ලබා දෙවන්නට ධර්මෝපදේශකයාව යොමු කරවන හොඳම අවස්ථාවක් බව අපි වටහා ගත යුතු වෙනවා.

ඒ අනුව ''මගේ කුඩාම සහෝදරයා සඳහා කරන ලද දෙය මටම කළාවේ '' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ පැවසූ වදන සිහිපත් කරන්නට හොඳම අවස්ථාවක් ගවලෙන් නිර්මාණය කිරීම තුළින් සෑම ආගමන කාලයක් තුළදීම අපට උදා වෙනවා නේද? මෙවර නත්තල් උදාවට පෙර මේ ගවලෙන සංකේතය සමග ඒ සුවිශේෂ ධර්මගුණය ගැන ගැඹුරින්ම හිතන්නට ඔබ වඩාත් අවධානය යොමු කරන්නට ඕනෑ.

බලන්න, එදා ශුද්ධවූ පවුලේ දේව මෑණියන් හා ජුසේ තුමන් අත් වින්ද දැඩි පීඩාකාරී තත්ත්වය. ඒ අසරණ භාවය තුළ අදත් වේදනා විඳින බොහෝ දෙනෙක් ඉන්නවා. සීතලයෙන් හා කුසගින්නෙන් පෙළෙන හා හඬන දරුවන් සැනසීම සඳහාත්, තනි කමෙන් හා නොසැලකීම නිසාත් අසරණව සිටින දෙමව්පියන්ට සැලකීම සඳහාත් සැබෑ දේව ප්‍රේමයක් දක්වන්නට යොමු කරවන ධර්මෝපදේශ ගුණයක් මෙහි අඩංගුව පවතින බව මේ ආගමන සමයේ අපි තේරුම් ගත යුතු අතරම ඒ ධර්මෝපදේශ අනගි පාඩම අපි නිවැරදිව වටහා ගත යුතු වෙනවා.

ආදර දුවේ පුතේ, ශුද්ධවූ පවුලේ සංකේතයත් අපේ පවුල් වලට හොඳ ආදර්ශයක් ගෙන එනු ලබනවා. ගවලෙන තුළ සංකේතවත් කරන ශුද්ධවූ පවුල ගෙන දුන් ආදර්ශය හා බිළිඳුන්ට පෙන්වූ ආදරය නැවත නැවතත් පවුල් වශයෙන් ගැඹුරු මෙනෙහි කිරීමක් දක්වා ගෙන යන්නට අපේ දෙමව්පියනට උපකාරී වෙනවා. මේ ධර්මෝපදේශය අවබෝධ කර ගන්නට අත්‍යවශ්‍යයෙන්ම වෙහෙසිය යුතු කාලය උදාවී ඇති බව ගවලෙන සංකේතයෙන් ඔබ සමාජයට පෙන්වා දිය යුතුයි.

බැහැපත් බවෙන් හා නිර්මලත්වයෙන් පූර්ණ වූ මරිය තුමියගේ පිළිගැනීම නත්තල් සමය තුළදී ලැබිය හැකි වැදගත්ම තිළිණය බවට පත් වෙනවා. ආදර දුවේ, පුතේ, අද ලෝකය තුළ පැන නැගී ඇත්තාවූ සියලු ගැටුම් හා එදිරිවාදී කම් පළවා හරින්නට ඇති එකම ක්‍රමය බැගෑපත් වීම නැතිනම් බැහැපත් වීම බව එතුමිය පෙන්වා දෙන මේ ආදර්ශය නත්තල් සමයේ අපට සැබවින්ම පසක් කරනවා.

ආදර දුවේ පුතේ, මේ සෑම ක්‍රියාකාරකමක් තුළම සැඟවී තිබෙන ධර්මෝපදේශය පැහැදිළි කර ගන්නට පුංචි ඔබ මේ ආගමන කාලය යොදා ගත යුතුයි. නත්තල් සිරිත් හා සංකේත තුළින් මතු වන පණිවිඩය වාණිජ ලෝකයට ගිල ගන්නට ඉඩ නොහැර පුංචි ඔබ එහි ධර්මෝපදේශය වටහා ගෙන සමාජය සමග බෙදා ගන්නට පෙරමුණ ගත යුතුමයි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# මන්නාරමේ ඓතිහාසික කතෝලික ඝාතනය

මන්නාරමේ ජනතාව අතර කිතු දහම සීඝ්‍රයෙන් පැතිර ගියේ ය. මේ අනුව මුළු මන්නාරම කිතුනු ගම්මානයක් බවට පත්විය. එකල මන්නාරම පැවැතියේ යාපනය බලහත්කාරයෙන් රජ කළ චෙකරාස සේකරන් හෙවත් සංකිලි යටතේ ය.

මේ වන විටත් හෙතෙම දකුණු වෙරළබඩ පළාත් අල්ලා ගෙන සිටි පෘතුගීසීන් සමග ගැටී සිටියේ ය. මේ නිසා මන්නාරමේ ජනතාව කිතු දහම වැළැඳ ගැනීම ගැන ඔහු තුළ බියක් ඇති විය. කිතු දහමත් පෘතුගීසීන් ගේ දේශපාලන කුටෝපයත් පටලවා ගෙන සිටි සංකිලි තුළ මෙසේ ඇතිවූයේ හුඹස් බියෙකි.

කෙසේ වෙතත් සංකිලි ඒ දුර්මතය ක්‍රියාවට නැගුවේ ය. හෙතෙම මන්නාරමේ කිතුනු පිරිස මර දමන ලෙස තම හේවායිනට නියෝග කළේ ය. මේ අනුව එහි කඩාවැදුනු හේවායෝ ගම්වාසීන් හය සියයකට වැඩි ප්‍රමාණයක් මරා දැමූ බව වාර්තා වන්නේය.

ඇතැම් වාර්තා මෙම සංඛ්‍යාව දක්වන්නේ හත් සියයක් ලෙස යි. ඉතිහාසඥ ශුභමර් පියතුමා දක්වන්නේ විශාල පිරිසක් මන්නාරම අතහැර දිවයිනේ සෙසු පළාත්වලට පැන ගොස් ඇති බව යි.



**සිරිලක කිතුනු 10 ඉතිහාසය**

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**

කෙසේ වුවත් ෆ්‍රැන්සිස් සාවියර් පියතුමන් මෙම දුක්මුසු පුවත ලද්දේ ට්‍රැවන්කෝර්හි මුක්කර පිරිසක් සමග සිටිය දී ය. මෙම පුවත ලද එතුමෝ කම්පාවට පත්වූහ. සැනෙකින් එහින් පිට වූ පියතුමා යාත්‍රාවක නැගී කුවිලොන් සහ කොච්චි නුවර වරායන් හරහා ගෝවේ නගරයට පිවිසියේ ය.

එහි දී ද සූසා ආණ්ඩුකාර තුමා හමු වූ සාවියර් පියතුමා ඉල්ලා සිටියේ රජු කළ වරදට දඬුවම් කරන ලෙස යි. පියතුමා මෙසේ ඉල්ලුම් කැර ඇත්තේ පළි ගැනීමේ චේතනාවෙන් නොව අනාගතය ගැන සිතාය. මේ අදමිටු ක්‍රියාව ගැන යමක් නො කළහොත් ඉදිරියට කිතු දහම වැළඳ ගැනීම ගැන ජනතාව තුළ බියක් ඇති විය හැකියැයි එතුමෝ සිතුහ.

එහෙත් පෘතුගීසීහු මේ ගැන කිසිවක් නො කළහ. ඔවුනට මේ අවධි යේ වෙනත් වැඩ කටයුතු රැසක් වූ බව වාර්තා වන්නේ ය. මෙයින් කල කිරුණු ෆ්‍රැන්සීස් සාවියර් පියතුමා ගෝවෙන් බැහැර වී ඉන්දියාව හැර පෙරදිග බලා පිටත් විය.

මන්නාරමේ කතෝලික ඝාතනය ශ්‍රී ලංකා කතෝලික ඉතිහාසයේ කීර්තිමත් අවස්ථාවෙකි. එසේම එය ආසියානු ඉතිහාසයේ ද ශු. ෆ්‍රැන්සිස් සාවියර් මුනි තුමගේ ධර්මදූත සේවාවේ ද රන් අකුරෙන් ලියැවෙන විශිෂ්ට සිදු වීමෙකි. මේ ගැන එතුමා රෝමයේ නිකා ශ්‍රේෂ්ඨයිනට ලියා ඇත්තේ මෙසේය. ''අප ස්වාමීන් වන දෙවියන් වහන්සේට ස්තුති වන පිණිස අද අප කාලයේ දීද ප්‍රාණ පරිත්‍යාගි වරුන් හිඟ නැත.

***මන්නාරමේ කතෝලික ඝාතනය ශ්‍රී ලංකා කතෝලික ඉතිහාසයේ කීර්තිමත් අවස්ථාවෙකි. එසේම එය ආසියානු ඉතිහාසයේ ද ශු. ෆ්‍රැන්සිස් සාවියර් මුනිතුමගේ ධර්මදූත සේවාවේ ද රන් අකුරෙන් ලියැවෙන විශිෂ්ට සිදු වීමෙකි. මේ ගැන එතුමා රෝමයේ නිකා ශ්‍රේෂ්ඨයිනට ලියා ඇත්තේ මෙසේය.***

සාමාන්‍ය ජනතාව ගෙන් ස්වර්ගය පිරී යාම සඳහා කලක් ගත වන අතර අප ස්වාමීන් වන දෙවියන් වහන්සේ ස්වකීය දේව බැල්ම යොමා මිහිපිට කෙරෙන කුරිරු ක්‍රියාවන් හේතුවෙන් විජයග්‍රාහි තෝරාගත් පිරිසක් විගස එහි ඇතුළු කර වන්නෝය.''

**(වී පර්නියෝලා ''ද පොර්චගීස් පීරියඩ් '' ප්‍රථම වෙළුම 54 පිටුව )**






ජාඇල වික්ෂෝපමාතා දහම් පාසලේ දරු දැරියෝ 61 දෙනෙක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබූහ. දරු දැරියෝ පුහුණු කිරීම මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ දහම් පාසලේ ආචාර්ය මණ්ඩලය එක්ව සිදු කෙරිනි. දේව මෙහෙය සඳහා තුඩැල්ල ක්‍රිස්තුරාජ ජාතික පාසලේ විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමන් හා තේවාචාර්ය ගරු ප්‍රියාන් සහෝදරතුමන් ද සහභාගී විය. දිව්‍ය පූජාවෙන් පසු ජා ඇල ශා. මරියා විදුහලේ විදුහල්පති නිහාල් ගුණසේකර මහතා නියෝජ්‍ය විදුහල්පතිනි රමනි ප්‍රනාන්දු මහත්මිය ගරු සහෝදරතුමන් හා දරුවන් පුහුණු කළ ගුරු මහත්මීන් සමූහ ඡයාරූපයකට මුහුණ දුන් අයුරු.

**නිශාන්ත රෝසා**



මතුගම ශා. මරියා දේවස්ථානයේ ළමෝ 28 දෙනෙකු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. ග්‍රේස් කුමාරි ළමා නිවාසයේ අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මේ දිව්‍ය යාගය පැවැත්විණි. ගරු දේවිෂාන් අසංක මීසම් සේවක පියතුමාගේ අනුශාසකත්වයෙන් ගරු පැවදි සොයුරියන් විසින් ළමුන් සූදානම් කළහ. දිව බොදුන් ලැබූ ළමුන් ගරු පියතුමන්ලා පැවදි සොයුරියන් සමග ළමා ප්‍රදීප කැමරාවට මුහුණ දුන් අයුරු.

**සුනීතා මාලනී**

**ළමා ප්‍රදීපය, නත්තල් කලාපය**

ළමා ප්‍රදීපය නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳුනු ළමා ඔබගේ නිර්මාණ දෙසැම්බර් මස 10 දිනට පෙර

**ළමා ප්‍රදීපය "නත්තල් කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.**

**සංස්කාරක පියතුමා**

# මීගමුව ආවේ මරියා ශාඛා පාසලේ සිසුවියක විදුහල් මාතාව රනින් බබළවයි

මීගමුව ආවේ මරියා ශාඛා පාසලේ සී. අනිෂා දිල්ෂානි ප්‍රනාන්දු ''සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා තරගාවලිය - 2012'' වයස අවුරුදු 17 න් පහළ කව පෙත්ත විසි කිරීමේ ඉසව්වෙන් ප්‍රථම ස්ථානය දිනා ගනිමින් රන් පදක්කමක් දිනීය. විදුහල් ඉතිහාසයේ පළමු වරට මෙවැනි පදක්කමක් දිනාගත් අනිෂා දිල්ෂානි සිසුවිය විදුහල්පතිනි ගරු සිරිමා ඕපනායක සොහොයුරිය සමග ළමා ප්‍රදීපය සඳහා ඡායා රූපයකට පෙනී සිටි අයුරු.



**(මෙල්වින් ද කොස්තා)**

# මැවුම්කාර දෙවි පියාණන් වහන්සේ ජීවිත අත්දැකීමක් කර ගත යුත්තේ කෙසේද යන්න පිළිබඳව "ජේසුගෙන් ළමා ඔබට" ලිපි පෙළෙන් මා උත්සහ කළෙමි.




**අවසන් ලිපිය**



මැවුම්කාර දෙවි පියාණන් වහන්සේ ප්‍රේමයය. ප්‍රේමය ඔබ තුළ බලගතු වන ප්‍රමාණයට උන්වහන්සේ ඔබ තුළ වැඩවසන සේක. ජේසුගේ බලගතු ආදරයේ බලය ඔබ අත්දකින සේක. එසේ නම් දරුවෙනි, ඔබ කළ යුතු ප්‍රධාන දේවල් කිහිපයකි.

1. ජේසු සමිඳුන් හා පියාණන් වහන්සේ එකම දෙවියන් ලෙස නිසැකව අදහා ගැනීම "ලෝකයා ජයගත හැක්කේ ජේසු ස්වාමින් වහන්සේ දේව පුත්‍රයා යැයි අදහන තැනැත්තාට ය. ලෝකයා පරදවන වික්‍රමය නම් "ඇදහිල්ලයි" ජේසුස් ස්වාමින් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන අදහන සියල්ලන් දෙවි පියාණන් වහන්සේ විසින් තමන් වහන්සේ සමග සබඳතාවයකට පමුණු වන සේක."



2. "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" යන ප්‍රේමයේ පනත තුළ ජීවත් වීමයි.



3. යාච්ඤා කරන්න.

4. දේව වචනය විශ්වාසයෙන් කියවා මෙනෙහි කරන්න.

5. 'ජේසුගෙන් ළමා ඔබට' ලිපි පෙළ නැවත කියවා මෙනෙහි කරන්න.

- ඔබගේ බුද්ධියෙන් දෙවිඳුන් ගැන දැනගන්න
- ඔබගේ හදවතින් දෙවිඳුන්ට ආදරය කරන්න
- ඔබගේ විශ්වාසයෙන් දෙවිඳුන් අත්දකින්න
- ඔබගේ ජීවිතයෙන් දෙවිඳුන්ට සාක්ෂි දරන්න.

දෙවිපියාණන් වහන්සේට නමස්කාර වේවා. තුති ප්‍රශංසා වේවා.



**ගරු ශිරෝමා ප්‍රනාන්දු**
ප්‍රැන්සිස්කන් නිකායික
පැවදි සොයුරිය

> පුරා දෙවසරක පමණ කාල පරාසයක් තුළ ළමා ප්‍රදීපයෙන් ඔබට කතා කරමින් ඉතා වටිනා ලිපි පෙළක් "ජේසුගෙන් ළමා ඔබට " අපිට තිළිණ කළ ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවදි සොයුරියට අපගේ ස්තුතිය පුද කරමු. ආදර දුවේ, පුතේ, ඔබත් ඔබගේ දිවියේ දී දේව විශ්වාසය අත්දැක්ක අවස්ථාවන් වෙතොත් නොපමාව ඒවා අපට ලියා එවන්න. ඉඩ ඇති අයුරින් ඒවා පළ කිරීමට අපි සූදනම්.
>
> **(සංස්කාරක පියතුමා)**






සේයා :- ශ්‍රියංගනී ෆිලීෂියා

**මාසික සිතිවිල්ල**

"නොවැම්බර් මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය විෂයට පෙරහුරු ප්‍රශ්න පත්‍රයක් !

**මෙවර කලාපයේදී විමසා බලන්නේ දෙවන ප්‍රශ්න පත්‍රයේ පළමුවන ප්‍රශ්නයට අදාළව ඉදිරිපත් වන ප්‍රශ්න 10 ට අදාළ ප්‍රශ්න 25 කි. හොඳින් අධ්‍යයනය කරන්න. මෙවැනි රටාවේ ප්‍රශ්න විභාගයේදී ඔබට ඉදිරිපත් වනු ඇත.**

**අලගොල්ලෑව ශා. අන්තෝනි මහා විද්‍යාලයේ ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

- ශුද්ධවූ පාවුලුතුමා ආධ්‍යාත්මික හා භෞතික ශරීරය ගැන කරුණු ගෙනහැර දක්වන්නේ කිනම් හසුනේද?
- පුරාණ ගිවිසුමේදී නව ගිවිසුමක් පිළිබඳව සඳහන් කරන දිවැසිවරයා කව්ද?
- පුරාණ ගිවිසුමේ විශිෂ්ටතම යාච්ඤා කෘතිය කුමක්ද?
- කිතුනු පවුලේ ඇති සම්බන්ධතාවය ක්‍රිස්තුන් වහන්සේට සහ ශුද්ධවූ සභාවට සම්බන්ධ කර කරුණු ගෙන හැර දක්වා ඇත්තේ කිනම් හසුනේද?
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව නමැති ලේඛනය කිතුනු පවුල හඳුන්වන නම කුමක්ද?
- සමගි සන්ධානය පිළිබඳව ශුද්ධවූ සභාවේ පනත කුමක්ද?
- මැවීමේ කතා පුවත් දෙක අයත්වන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.
- තමාගේ ගැලවීමත් , අන්‍යයන්ගේ ගැලවීමත් සලසා දෙන ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
- මෙරට දහම් දූත සේවාවට පළමුවෙන්ම පැමිණි ධර්මදූත නිකාය නම් කරන්න
- ආරණ්‍යවාසී තපසුන් අතර පළමුවැන්නා කව්ද?
- සාධාරණ ලෙස වස්තුව ලබා ගත හැකි මාර්ග දෙකක් ලියන්න.
- ''කතෝලික සහා එකමුතුකම ගොඩනැගීම'' යන්න පොදු පූජකවරයේ කිනම් කාර්යය හා සම්බන්ධද?
- ප්‍රසාද ස්නාපනයෙන් හිමිවන පොදු පූජකවරය සුවිශේෂී තත්ත්වයට පත්වන දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
- සියලුම පැවදි පන්තිවලට පොදු ගුණධර්ම දෙකක් නම් කරන්න.
- ශුද්ධවූ අගුස්තීනු තුමා පාපොච්චාරණය හඳුන්වන නම කුමක්ද?
- කල්කටාවේ තෙරේසා මව්තුමිය තමාගේ ජීවිතය තුළ සම්බන්ධවූ පැවදි නිකායන් දෙක නම් කරන්න.
- 2012 / 2013 වසර කතෝලික සභාව නම් කර ඇත්තේ කිනම් නමින්ද?
- යෙසායා දිවැසිවරයා ක්‍රිස්තුන්වහන්සේ හා උන්වහන්සේගේ සේවක ස්වභාවය පිළිබඳ කරන අනාවරණයන් දෙකක් ලියා දක්වන්න.
- ස්වර්ගයෙහි වැඩ සිටින යාච්ඤාව සඳහන් සුවිශේෂ දෙක නම් කරන්න.

ඉතිරිය 14 පිටුවේ .....

# මතකය අලුත් කළ මිතු දම




ආදර දුවේ පුතේ,

මෙද කැමතියි එක් සුවිශේෂි සිදුවීමක් පිළිබඳව ඔබත් සමඟ බෙද හද ගන්න. අද ලෝකය ගොඩක් වෙනස් වෙලා. විද්‍යාවයි තාක්‍ෂණයයි දියුණු නිසා වැඩ කටයුතු පහසු වෙලා. මිනිසුන්ගේ ජීවිත අද හරිම සංකීර්ණයි. කාර්යබහුලයි. මේ ලෝකෙ විසිතුරු දේවල් එසේත් නැතහොත් භෞතික දේවල් වලින් අලංකාර වුවත්, ලොකු අඩුවක් තියෙනවා. මිනිස්සු ගැන සිතා කල්පනා කිරීම, මානුෂියව සිතා බලා කටයුතු කිරීම උදව් පදව් කර ගැනීම ඉතා අඩුයි. කෙටි යෙන්ම කිව්වොත් මිනිසකුට තවත් මිනිසකුගේ මුහුන බලා සිනා සීමට , කතා කිරීමට, ස්තුති කිරීමට ඇගයීමට වේලාවක් නැති තරම්.

පසුගිය සතියේ දිනක පෙ.ව. 7.00 ට පමණ මරදන දුම්රිය පල ඉදිරිපිට විශේෂ රාජකාරි කටයුත්තක් සඳහා නාරාහේන්පිට බස් රථයක් එනතුරු බලා සිටින අතරවාරයේ මා උසස් අධ්‍යාපනය ලැබූ කොළඹ විශ්ව විද්‍යාලයේ හිතවත් සොහොයුරෙක් දුටුවා. ඔහු එවකට නීති පීඨයේ සිසුවකු වශයෙන් සිටියත් අද ඔහු නීතිඥ වරයෙක්. එහෙත් ඔහුගේ වෙනසක් තිබුනා. ඔහු සුදු සැරයටියක් ආධාරයෙන් තමා ගමන් කළේ. දෑස් අන්ධ වුවත් ජීවිතයට ඉතාම හොඳින් මුහුණ දී ජීවිතය ජය ගත් අයෙකි. මොහුව මා දුටු විගස කෙතරම් ජනාකිර්ණ ප්‍රදේශයක් වුවත් කලබලකාරි තත්ත්වයක් තිබුණත් මා තීරණය කළා ඔහුත් සමග කථා කරන්න.

මා ඔහු ළඟට ගොස් දෑස් අන්ධ නිසා ඔහුගේ පිටට සෙමින් තට්ටු කර ගාමිණී මම නිමාලි ‘‘හරියටම වසර 20 ට පසු මුණ ගැසුනු මගේ හිතවත් සහෝදරයාට ආමන්ත්‍රණය කළා.’’ ආ.... ඔව් මට මතකයි ඔයා ඇන් නිමාලි නේද? විශ්ව විද්‍යාලයේ ඉන්න කොට ගීත ප්‍රසංගයක් තිබ්බා නේද? මේ ආදි වශයෙන් මගේ තොරතුරු එක දිගට පෙළගස්වන්න පටන් ගත්තා.

කෙසේ වෙතත් මේ දෑස් අන්ධ මගේ හිතවත් සොහොයුරා එද පටන්ම අනෙක් අයගේ සතුටුදායක මෙන්ම දුක්බදායි අවස්ථාවලදීද උදව් වූ කෙනෙකි. ඒත් අද මිනිස්සු ගොඩක් වෙනස්. උදේ අවදි වූ මොහොතේ සිට රාත්‍රී නින්දට යන අවස්ථාව දක්වා හිතන්නේ මුදල් වාසි ප්‍රයෝජන. ඒ නිසා මිනිස්සුන්ව අමතක කර දමනවා. උදව් පදව් කරන්න වෙයි කියලා පලා යනවා. නැත්නම් නොදැක්ක නොඇසුනා සේ හැසිරෙනවා. ඒ නිසා ආදර දුවේ පුතේ, ඔබ කොයිතරම් උගතෙක් බුද්ධිමතෙක් වුවත් මනුස්සකම ප්‍රේමය කියන දේ නම් අමතක කරන්න එපා.

✍ ජී .ඒ නිමාලි ප්‍රනාන්දු - ගුරු මව

# සා. ලෝරන්ස් ප්‍රාථමික ළමුන්ගෙන් විවිධ ප්‍රසංගයක්.



කොළඹ 06, සා. ලෝරන්ස් කන්‍යාරාමයේ ප්‍රාථමික සිසුදැරියන් විසින් ඉදිරිපත් කරන ලද විවිධ ප්‍රසංගය නොබෝදා දෙහිවල එස්. ද. එස් ජයසිංහ අනුස්මරණ ශාලාවේදී පැවැත්වුණි. අධ්‍යාපන අමාත්‍යංශයේ සෞන්දර්ය අංශයේ අධ්‍යක්ෂ හා ප්‍රවීන සංගීතඥ එඩ්වඩ් ජයකොඩි මහතා, සමන්ති විද්‍යාපති මහත්මිය කතෝලික පාඨශාලා සාමාන්‍යාධිකාරී ගරු රංජිත් මදුරාවල පියතුමාගේද ප්‍රධානත්වයෙන් පැවති අතර ප්‍රාථමික සිසුන්ගේ විශේෂාංගයන් රාශියකින් ප්‍රසංගය ඔපවත් විය. මෙම ප්‍රසංගය සාර්ථකව පැවැත්වීමට ප්‍රාථමික අංශ ගුරු භවතුන්ගේ උත්සහය හා නොමද කැපවීම මහෝපකාරී විය. සිසුවියන් ඉදිරිපත් කළ විශේෂාංගයක් මෙහි දිස්වේ. ෂර්ලීන්

**“උපත” නත්තල් සඟරාවෙන් ළමා ප්‍රදීපය නිර්මාණ කරුවන්ට ඇරියුමක්.**

නත්තල වෙනුවෙන් එළිදක්වන ’’උපත’’ සඟරාව සඳහා ළමා නිර්මාණ යොමු කරන ලෙසට එහි සංස්කාරක ප්‍රියන්ත පීටර්ස් මහතා නත්තල හා බැඳුණු ඔබගේ ළමා නිර්මාණ දෙසැ. 05 දිනට පෙර සංස්කාරක ‘‘උපත ’’ නිමල මරියා මාවත වෙන්නප්පුව යන ලිපිනයට යොමු කරන ලෙස ඉල්ලා සිටී.

(කුමර නයනජිත්)

# ගුරු මෑණියනී.....






මහමෙරක සෙනෙහසක් සිත වටේ තවරලා
මවක සේ ළඟින් හිඳ ජීවිතය හුරු කළා
කුරුලු පැටවුන් වගේ ඔබ වටේ දැවටිලා
විශ්වයම උගනින්න අපිත් අද හුරුවෙලා
පියාපත් ලැබමුත් ලෝකයට පියාඹන්න
බැහැ අපට කිසි දිනෙක ඔබ අතැර දුර යන්න
දැන් ඉතින් ලංව ඉමු කිසිදිනෙක නොකියන්න
ඔය සෙනේ ළඟ හිඳින් සැනසෙන්න. ඉඩ දෙන්න

**ජීවනී සකුන්තලා ප්‍රනාන්දු**
9 ශ්‍රේණිය , සාන්ත හෙලේනා දහම් පාසල - හිරිපොකුණ

# ආදර ජේසු අම්මේ



ජේසු අම්මේ මේ අහන්න
ඔබේ දරුවන් දෙස බලන්න
ඔබේ ළඟට තුරුළු වෙන්න
මට හරි ආසයි

**විමුක්ති පෙරේරා**
4 ශ්‍රේණිය
ධර්මදූත ළමා සමාජය - මාතලේ

# උදෑසන අසිරිය



රතු ගිනි ගෙඩියක්
නැගිලා එනවා
කුරුලු රංචුවක්
පියඹා යනවා
වෙල්යායේ දලු
උඩට එබෙනවා
උදයක අසිරිය
අපට ගෙනෙනවා

**රමෝනා වැන්හොෆ්**
8 ශ්‍රේණිය , ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය
මොරටුව

# පොදු දේපළ සුරකිමු

පොදු දේපළ යනු මහජනයා සතු සම්පතකි. රෝහල්, පාසල්, ප්‍රවාහන සේවා, දුම්රිය හා මහා මාර්ග, බස් රථ , රජයේ ගොඩනැගිලි ආදිය උදාහරණ ලෙස දැක්විය හැක. තවද පොදු මහජන සේවාවන් සැපයීම සඳහා මහජන මුදල් නඩත්තු කෙරෙන ආයතන වීම නිසාත් පොදු දේපළ ලෙස හැඳින්වේ. මේවැනි පොදු දේපළ පෞද්ගලික පරිහරණය සඳහා නොගත යුතුය. එසේ වුවහොත් එය ජාතික අපරාධයකි. දැයේ දරුවන් වන අප පාසලේ හා අනෙකුත් පොදු දේපළ නිසි ලෙස රැකගෙන අනාගත පරපුරට භාරදිය යුතුව ඇත.

**සේසත් මධුහාර**
9 ශ්‍රේණිය
ශුද්ධවූ ජපමාල රාජේශ්වරියගේ දහම් පාසල - ගාල්ල

# දෙව් සමිඳුනි



පියවෙන නෙතු මායිමේ මැවෙන
ඝනඅඳුර
නිමේෂයකින් පහව යන්නේ පියවුනු
නෙත් විවර වූ විටදීය.....
කොපුල් දිගේ නෙතසිලිල් වෑහෙන්නේ
නෙතට කඳුළැලි බර නිසාම ය.....
නෙතු මතට කඳුළක් නැගෙන්නේ
හදේ දුක් ගිනි දැවෙන විටකය
කඳුළු අතරින් සිනාසෙන්නේ
''ජීවිතය'' නම් එය නිසාමය.....
හිරු මායිමේ සඳු නොමැත්තේ යම්
සේද සිනහව අබියස කඳුළට ඉඩහසරක් නැත්තේමය
නැගුණිද හදට දුක්ගිනි බාධක නොතැවී සිනහ නගන්නේ
සදා රැඳෙන මේ සිනහවේ මැවුම්කරු දෙව් සමිඳුනි
ඔබ නිසාමය......

**ඈන් දිනේෂිකා**
13 ශ්‍රේණිය , සිරිකුරුස විදුහල - ගම්පහ

පිපෙන මල් උයාය

# පයාගල සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසලේ සහ බොල්ලත සිරිහඳ දහම් පාසලේ ශූර ළමා ලේඛකයෝ. (වැඩමුළුවක ප්‍රතිඵලයන්)

## නොයනු මා හැරදා කිසි දිනේ

ඔබ අත් අල්ලන් පිය
මනිනා විට ජීවිත මං පෙත
නොදැනුනි මා හට විඩාවක්
ඔබේ සුරතින් ගිලිහි ගිය විට
තනිකමක් , පාළුවක්
දැනුනි මා හට
සමිඳුනි , නොයනු මා හැරද
කිසි දිනේ



**සුමුදු නිසංසලා ප්‍රනාන්දු**
9 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල

## පිය සෙනෙහස



නොදැරුවත් මා දස මසක් කුසේ
නොපෙවුවත් ලේ කිරි කර මා හට
දැක්වූ ආදරය ඔබ මා හට
මහ සයුර මෙනි පියාණෙනි

හිරුට කලින් පිබිදී විගසින් කන්තෝරුව
කරා පියමන් කර
මුළු දවසම වෙහෙසී අප වෙනුවෙන්
දවස ගෙවා
සැඳෑ අඳුර ලංවෙද්දී නැවත නිවස
කරා පියමං කර
සෙනෙහසින් අප වැළඳ ගන්නේ සෙනෙහෙබර
ඔබමයි පියාණෙනි

**නිල්මිණි ආනන්දිකා**
9 ශ්‍රේණිය , සිරිහඳ දහම් පාසල - බොල්ලත

## ආදර විදු මව්නි

නෙළුමක් පරදන සුන්දර සිනහ පාමින්
විදු බිම වෙත පා නැගූ අප, හෙට පිපෙන්නට වෙර දරණ
පුංචි කැකුළියන් වෙමු......
නැණ නුවණ හා ගතිගුණ එකට කැටිකොට පොවා
අඳුරෙන් ආලෝකය සොයා යාමට
පාර පෙන්විය මව්නි ඔබ.....
සමාජයට උදාර කාන්තාවන් බිහිකිරීමට
අව්‍යාජ බව හා සරල බව අප ජීවිත වලට ලබා දීමට
ඔබ දරනා උත්සාහය ඉතා අගනේය .....
දෙව්දූ රැකවරණය ලබමින් මරිමව් සළුවේ පහස ලබමින්
පස්වෙනි සංවත්සරය සැමරූ
මෑණියනේ ඔබට .......
මගේ සුබ පැතුම් !

**වරුනි මධුහංසනී**
10 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල

## සමනලයා

මලින් මලට ගොස් පැණිබොන්න
පොඩි ළමයින් හට අල්ලන්න
දුව ගොස් කොළ යට හැංගෙන්න
ආසයි සමනලයකු වන්න



උදේ පාන්දර නැගිටින්න
ඉක්මනටම මල් වෙත යන්න
ඒ මල් වල පැණි බී එන්න
ආසයි සමනලයකු වන්න

**ලක්ෂි දිනෙල්කා**
8 ශ්‍රේණිය , සිරිහඳ දහම් පාසල - බොල්ලත

**පයාගල හා බොල්ලතදී පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවන් හි තවත් සාර්ථක නිර්මාණයන් ඉදිරියේදී පල කෙරේ (සංස්කාරක පියතුමා)**

# වෙන්නප්පුවේ දේව කැඳවීම් දිනයක් !

දේව කැඳවීම උදෙසා වඩ වඩාත් දහම් පාසල් දරුවන් පෙළගැස්වීමෙ අරමුණින් වෙන්නප්පුව ශු. ජුසේ මුනිදුන්ගේ දෙව් මැදුරේ දී දේව කැඳවීම් දිනයක් පැවැත්වුණි. සිරිලක විවිධ නිකායන්හි ගරු පියතුමන්, පැවදි සොහොයුරියන් සහ සහෝදර තුමන් ඇතුළු දහම් පාසල් දරුවන් දෙමාපියන් සහ ගිහි පාර්ශ්වයේ විශාල පිරිසක්ද එදින එම අවස්ථාවට සහභාගි වූහ. මේ එහි විවිධ අවස්ථා දැක්වෙන ඡායාරූප කිහිපයකි. **සටහන - ප්‍රියන්ත පීටර්ස් / සේයා - ජේ.කේ මයිකල් පෙරේරා**





### තරාල සිරිකුරුස දහම් පාසල




තරාල සිරිකුරුස දහම් පාසලේ අරමුදල වර්ධනය කර ගැනීම සඳහා දෙවන වරටත් පොළක් පැවැත්විණි. සිරිකුරුස දහම් පාසලේ දහම් ගුරු මඩුල්ල මීසම් සේවක ගරු සුමිත් රෝෂන් පියතුමන්ගේ අදහසකට අනුව මෙවරද සාර්ථක ලෙස සංවිධානය කළ පොළ සඳහා මීසමේ සියලුම සමිති සමාගම්, තරුණ කණ්ඩායම් , දහම් සේවා සභාව මහත් උද්‍යෝගයෙන් , කැප වීමෙන් දායකවිය. මීසම් ජනතාව මෙන්ම අවට ගම්වල ජනතාවද අරමුදල වර්ධනය කර ගැනීමට ඔවුන්ට හැකි පමණින් දායකවිය. සේයා රුවෙන් දැක්වෙන්නේ පංති මට්ටමින් සංවිධානය කර තිබූ වෙළඳසල් පියතුමාගේ නිරීක්ෂණයට ලක් වූ අයුරුය. **සමන්කාන්ත සිල්වා**



### අඹකඳවිල මීසමේ දහම් ළමුන්ට බයිබල් දැනුම මිනුම තරගාවලියක්

අඹකඳවිල මීසම් දුවා දරුවන්ගේ බයිබලීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් මීසම් දහම් පාසල් මට්ටමින් බයිබල් දැනුම මිනුම තරගාවලියක් පැවැත්වුණි. මෙහි පළමු අදියර වශයෙන් මීසමේ සියලුම දහම් පාසල් වලින් පළමු වටයේ තරග පවත්වා ළමුන් තෝරා ගන්නා ලදි. මෙලෙස තෝරා ගත් දරු දැරියන් හට වෙන් වෙන් වශයෙන් තෝරා ගත් බයිබලීය කොටස් ඇසුරින් පුළුල් දැනුමක් ලබා දුනි.

අවසානයේදී එක් කණ්ඩායමකට පස් දෙනෙකු බැගින් තෝරා මීසමේ දහම් පාසල් අතරෙන් තරගකරුවන් ඉදිරිපත් කර අවසාන මහා තරගය පැවැත්විණි. මෙම තරගය පැවැත්වීමට මීසම් සේවක ගරු බෙනට් ශාන්ත මීසම් සහයක ගරු ඩෙනිස් ගයාන් යන පියතුමන්ලා පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත පියතුමා, ගරු එස්තර් පැවදි සොහොයුරිය, ගරු ප්‍රභාත් ක්‍රිශාන්ත සහෝදරතුමාද සියලුම දහම් ගුරුවරුන්ද විශාල සහයෝග යක් ලබාදුනි.

**අජානි නිශේලා ප්‍රනාන්දු - අඹකඳවිල**

# ඔලිම්පික් ඉතිහාසය හා සබැඳුනු මුද්දර

**(පසුගිය ලිපිය හා සබැඳේ)**

මෙහි දෙවන පේළියේ දැක්වෙන්නේ ඇටික් අම්ෆෝරා නම්වූ මුද්‍රික පානය (වයින්)බහාලන බඳුනක් දැක්වෙන මුද්දර දෙකකි. අළු පැහැති ලෙප්ටා 20 ක් වු සහ නිල් පැහැති ලෙප්ටා 40 ක් වු මුද්දර යි ඒ.



**ඔලිම්පික් ඉතිහාසයේ නම රැන්දු මුද්දර කාණ්ඩය**

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

**මෙම මුද්දර 12 පළමු වසර තුළ 10,000 ක් අලෙවි වු අතර දෙවන මුද්‍රණයේදී නිකුත් වු මුද්දර 75,000 ද උණු කැවුම් මෙන් අලෙවි විය. මෑතකදී ප්‍රකාශිත මුද්දර ප්‍රකාශන වාර්තාවක් අනුව මෙම මුද්දර කාණ්ඩයේ වත්මන් නිල තක්සේරු වටිනාකම ඩොලර් එක් ලක්‍ෂයකි.**

ඉතිරි දිගැති මුද්දර වලින් එකක් අශ්වයින් 4 දෙනෙකුගෙන් යුත් රථයක් මත නැඟී සිටින ග්‍රීක සාහිත්‍යයේ සඳහන් ''ජයග්‍රහනයේ දෙවඟනගේ ''රුව රැගත් ලා රතු පැහැති ලෙප්ටා 25 ක් වු හා අනෙක එම රූපයම රැගත් තද අළු පාටින් යුත් ලෙප්ටා 60 ක මුද්දර වේ.

අවසාන පේළියේ දුඹුරු පැහැති ඩ්‍රැක්මා 10 ක වටිනා කමින් යුක්ත මුද්දරය ඇතැන්ස් නගරයේ සුප්‍රසිද්ධ සළකුනක් ලෙස සැලකෙන ''ඇකොපොලිස් '' ග්‍රීක බලකොටුව දැක්වේ. ලා නිල් පැහැති ඩ්‍රැක්මා 1 ක් සඳහන් මුද්දරය ඔලිම්පික් ක්‍රීඩාගාරය හැඩග න්වයි.

ඩ්‍රැක්මා 2 ක වටිනාකමින් යුත් ලා අළු පැහැති මුද්දරය සුප්‍රසිද්ධ ''ප්‍රැක්සිටෙලස්' ප්‍රතිමාවත් ඩ්‍රැක්මා 5 ක වටිනා කමින් යුත් ''ජයග්‍රහනයේ දෙවඟන'' ප්‍රතිමාව කොළ පාටින්ද යුක්තවේ.

මෙම මුද්දර 12 පළමු වසර තුළ 10,000 ක් අලෙවි වු අතර දෙවන මුද්‍රණයේදී නිකුත් වු මුද්දර 75,000 ද උණු කැවුම් මෙන් අලෙවි විය. මෑතකදී ප්‍රකාශිත මුද්දර ප්‍රකාශන වාර්තාවක් අනුව මෙම මුද්දර කාණ්ඩයේ වත්මන් නිල තක්සේරු වටිනාකම ඩොලර් එක් ලක්‍ෂයකි. (ලක්‍ෂපතියෙක් වන්නට ඔබටත් වාසනාව ලැබේවා

මීළඟ ලිපියෙන්
මුද්දර ඇනුම විෂය බද්ධ
කිරීම ගැන කථා කරමු

**සිරිල් පෙරේරා**
මල්කඩුවාව



**අපේ පවුල**

**වර්ෂා සයුරංගි**
1 ශ්‍රේණිය
ලොයොලා විදුහල
බෝපිටිය



**ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රතිහාර්යයක්**

**තරුෂි හිමායා**
02 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
මාරවිල

**දිය බොන මුවන්**
**මිලාන් ජීවන්ත**
04 ශ්‍රේණිය,
නිර්මල ලූර්දුමාතා දහම් පාසල
කලාඔය





**මල් බඳුනක්**
**රයන් පෙරේරා**
7 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල - බොල්ලත

**නිර්මල හෘදයේ දේව මාතාවන්**

**තරුෂි නයනතාරා**
04 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
දුනකදෙණිය



**මෝස්තරයක්**
**සඳුනි වාසනා**
8 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල - පයාගල



**හංස රංචුවක්**
**එශිනිකා ෂෙමෝදි**
07 ශ්‍රේණිය
සිදුතරු දහම් පාසල - දූව





**දිය රැගෙන ඒමට යන කාන්තාවක්**
**ලක්මි මධුෂාණි.**
05 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
හාල්දඩුවන

# ශා. ලුසියා මුනිවරිය



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

**ශා. සභා මාතාව උඳුවප් මාසයේ සමරන මංගල්‍යයන් අතර දෙසැම්බර් 13 වන දින සැමරෙන ප්‍රාණපරිත්‍යාගි ශු. ලුසියා කන්‍යාවියට ද හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. ඇය උපත ලැබුවේ ඉතාලියේ සිසිලි දූපතේ සිරාකුස්හි ග්‍රාමයේ රදළ ධනවත් උසස් පවුලකට දාවය.**

සිය යොවුන් වියේදීම තම දිවියේ එකම ස්වාමිත්වය දෙවි සමිදුන් වෙත පුදදෙන්නට උත්සුක වූ ඕතුමිය තරුණ වියේදීම තම කන්‍යභාවය නොකැළැල් ජේසුසමිඳුන් වෙත ත්‍යාගයක් ලෙස බාර කරන්නට සිතා ගත්තාය. ඇගේ පියා ස්වර්ගස්ථ වූ පසු ඇගේ වැන්දඹු මව ධනවත් උසස් පවුලක අන්‍යාගමික තරුණයකුට විවාහ බස් දීමට ඇයට බලකර සිටියාය.

එහෙත් ලුසියා ඇගේ අන්‍යාගම්කාර තරුණයාට තම කන්‍යභාවයේ භාරය හා තමන් දෙවිසමිඳුන් වෙත දුන් පොරොන්දුව පිළිබඳව ප්‍රකාශ කළාය. පසුව ඔහු ද ඇගේ මේ තීරණය හා පොරොන් දුව ට ගරු කරමින් ඇයව විවාහ කර නොගන්නා බවට පොරොන්දු වූවේය. එකල ලුසියාගේ මව ලේ මාල් රෝගයෙන් පෙළී



බොහෝ දුක් වින්දාය. තම දියණියගේ බලවත් කීම හා බලපෑමත් මත ඉතාලියේ කනාකියා නුවර තැම්පත් කර තිබූ ශා. ආගතා මුනිවරියගේ සොහොන වෙත වන්දනා ගමනක නිරත වූවාය. මේ ස්ථානය ස්පර්ශ කළ සැනෙන්ම ඇගේ මව හට සුවය ලැබුවාය. මේ මුළු ගමනට සැතපුම් 50 ක් පමණ වූ අතර ඒ ගමන් මඟ මේ දෙදෙනා පයින්ම ගමන් කළෝය. නිමක් නොමැති ස්තුතිය හා ප්‍රශංසාව සමිඳුන් වෙත දුන් ලුසියාවන්, මවගේ ද අවසරය ඇතිව තම පාරම්පරික වස්තුව දුප්පතුන් අතර බෙදා දුන්නාය. මේ පිළිබඳව ඇඩි කෝපයට හා තන්හාවට පත් සිය අන්‍යාගම්කාර පෙම්වතා ඇය කතෝලිකයකු යැයි සිසිලියේ ආණ්ඩු කාරවරයා වෙත පමුණුවනු ලැබීය. මේ කාලය වනාහි දියොක්ලිසියානු අධිරාජයා විසින් ශු. සභාව වෙත දරුණු පීඩා සමයක් එල්ල කළ කාලවකවානුවකි. මෙය වනාහි දරුණුතම හා අවසාන වසංගතය හා පීඩනය විය. මෙහිදි මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුන්ට වැඳුම් පිදුම් කිරීමටත්, ඔවුන්ගේ පිළිම වලට වන්දනා කිරීමටත් ලුසියා වෙත අණ කරන ලදී. එහෙත් ඇය සියල්ල කඩා බිඳ දමා ප්‍රතික්ෂේප කළාය. එම නිසා කෝපයට පත් අගරජ ලුසී කන්‍යාවිය ඉතාමත් ලැජ්ජා සහිත දරුණු වද ගාවිනා වලට භාජනය කෙරිණි. මෙහිදි ඇගේ ඇස් උගුල්ලා දැමීය. තවද ඇගේ උගුර තියුණු කඩුවකින් ඇන සිදුරු කර දැමීය. අවසානයේදී හිස ගසා දමමින් මැරීමෙන් ඇය ප්‍රාණපරිත්‍යාගි කිරීටය හිමිකර ගත්තාය. ඒ නිසා ලුසියා මුනිවරිය ඇස් අමාරුවලටද, උගුරේ ආබාධ වලටද, ලේ මාලේ රෝගයටද, වසංගත රෝග වලටද, ආරක්ෂක මුනිවරිය ලෙස ශු. සභාව නම් කර ඇත. තවද කොළඹ අගරදගුරුවසමේ ආසන දෙව්මැඳුර මෙතුමියට කැපකර ඇති අතර, අගරදගුරු වසමේ නාමසාන්තුවරියක ලෙසද මෙතුමිය නම් කර ඇත.

**අසේල දසනායක**

# ප්‍රහේළිකා අංක 34



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

හරහට

1. මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජනතාවගේ නායකයා වශයෙන් පත්වූයේ මොහුය.

3. ක්‍රිස්තුන් වහන්සෙ, මනස්ථාපනය නොවූ නගරවල වැසියන්ට කථා කරමින් ''දේව විනිශ්චය දවසේදී ඔබට වඩා .................... හා සිදොනයට සහනය ලැබෙන්නේ යැයි'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

4. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ අවස්ථාවල මෙය කඩ කළ බවට විනධරයන් හා පරිසිවරු ක්‍රිස්තුන් වහන්සේට චෝදනා කළෝය

5. ''මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න'' එවිට ඔබට ............ ලැබෙනු ඇති'යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළුනු ස්ත්‍රීයක් ක්‍රිස්තුන් වහන්සේගෙන් සුවය ලබාගත්තේ මහත් විශ්වාසයකින් යුතුව මෙය ස්පර්ශ කිරීමෙනි.

පහළට

1. දේව මෑණියන්ගේ පියාගේ නම

2. ''මගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ .......... ඇතැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ශු. බයිබලයේ නව ගිවිසුමෙහි ශු. පාවුළු තුමා විසින් යවනු ලැබූ හසුන් පත්වලින් එකකි.

5. තමන්ට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙම වාර ගණන දක්වා පමණ දැයි පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

6. යක්ෂයා , ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින් ලෝකයේ සියල් රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු ආදිපත්‍යයද ඒවායේ........ ඉසුරුද ලබා ගැනීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස ඉල්ලීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මතෙව් 11/18, ශු. ලුක් 4,8,9,6 , ශු. ජුවාම් 14,)

06 පිටුවෙන් ....

## සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය .........

★ එපීස 6/14-17 සඳහන් සත්‍යවාදීව ජීවත්වන්න ඔබට මග පෙන්වන ඔවදන් දෙකක් ලියන්න.

★ ''ඔබ තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩ ගැසෙන තුරු ඔබ උදෙසා නැවතත් මම ප්‍රසව වේදනා විඳිමි'' යනුවෙන් සඳහන් කරන්නේ කව්ද? කිනම් ලිපියකද

★ කතෝලික සභාව දේව අනාවරණය අපට පහදා දෙන මාර්ග දෙකක් (තුන) නම් කරන්න.

★ භාවනාවේ පියවර හතර අතරෙන් තෙවන පියවරේදී අප අත් හැරිය යුතු අයිතීන් කවරේද ? දෙකක් සඳහන් කරන්න.

★ උත්තම පූජක යාච්ඤාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.

★ කතෝලික විවාහය තුළ අඩංගු පොරොන්දු දෙකක් ලියා දක්වන්න.

**මෙම ප්‍රශ්න වලට පිළිතුරු ලබන සතියේ .......**

## පමුණුගම මහ විදුහලේ සිසුවියකගෙන් සංයුක්ත තැටියක්

පමුණුගම මහවිදුහලේ ඉගෙනුම ලබනා උපේකා හිරුණි වාසනා සිසුවිය ' සොඳුරු සිහිනයක්' නමින් සංයුක්ත තැටියක් එළි දැක්වූවාය. පමුණුගම විදුහල් ශාලාවේදී විදුහල්පති අනුර ගුණවර්ධන මහතාගේ සංවිධාන යෙන් පැවැති මෙම උළෙලේදී විශාරද එඩ්වඩ් ජයකොඩි කලාකරුවාණන්ට මෙය පිලිගැන්වූ අයුරු සේයාරුවෙහි දැක්වේ. බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන්ද සිල්වා පියතුමාද මෙහි වෙති. බෙන්ජමින් කිරිහෙට්ටි




රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
24
කථාව :- ආනන්ද කාලිදේරා.
දෙබස් චිත්‍ර :- ආර්.ඩී.පී. සදුආරච්චි
..මේ දෙන්නත්... කුමාරය හිටපු ගල් පරය ළඟට ගියා..
කුමාරයටයි කුමාරියටයි.... ..හරිම සතුටුයි.. ..ගොඩක් කාලෙ කින්නෙ දෙන්නම.... මුනගැහුනෙ...
කුමාරි...
දෙන්න ටිකෙන් ටික ළංවෙලා ආදරෙන් කථා කරන්න... ..පටන් ගත්තා
කුමාරි ඔයා එහෙනම් කුමාරයත් එක්ක කථා කරන්න.. මම අර පැත්තට යනවා..
මායාකාරියගෙ දුව ඒ දෙන්නට කථා කරන්න ඉඩ දීලා.. රත්තරං පාට... මාළු සිංදු කියන පැත්තට ගිහින් ඒ දිහා බලා බලා විනෝද වුනා...
කුමාරියයි, කුමාරයයි පහුගිය කාලෙ ඒ දෙන්නට වෙච්ච දේවල් කථා කරන්න පටංගත්තා..

ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව

# අසීසි නගරයේ දිළින්දා

02

